© සියලු ම හිමිකම් ඇවිරිණි

අනු අංකයඃ ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ සංගමය
# අන්තර්මධ්‍ය අදියර
# 2009 මාර්තු විභාගය

විභාග දිනය : 2009 මාර්තු 21 පිටු ගණන : 08
විභාග වේලාව : පෙ.ව. 9.30 - ප.ව. 12.30 ප්‍රශ්න ගණන : 05

<u>අයදුම්කරුවන්ට උපදෙස්ඃ</u>

1. නියමිත කාලය <u>පැය 3</u> කි.
2. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
3. පිළිතුරු සැපයිය යුත්තේ <u>සිංහල</u> භාෂාවෙන් පමණි.

| **විෂය** | **විෂය සංකේතය** |
|---|---|
| **මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය** | **(FAR / 601)** |

---

**<u>ප්‍රශ්න අංක 01</u>** *(ලකුණු 18)*

සීමාසහිත අසංග සමාගමේ හා සීමාසහිත බණ්ඩාර සමාගමේ 2008.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කරන ලද ආදායම් ප්‍රකාශ පහත වේ.

| | **රු.'000** | |
|---|---|---|
| | **සී/ස අසංග** | **සී/ස බණ්ඩාර** |
| විකුණුම් | 62,500 | 25,470 |
| විකුණුම් පිරිවැය | (20,680) | (10,230) |
| **දළ ලාභය** | **41,820** | **15,240** |
| වෙනත් ආදායම් | 2,980 | 2,070 |
| බෙදාහැරීමේ පිරිවැය | (7,704) | (5,370) |
| පරිපාලන වැය | (8,014) | (3,924) |
| වෙනත් වැය | (1,870) | (932) |
| මූල්‍ය පිරිවැය | (5,780) | (1,530) |
| **වර්ෂයේ ශුද්ධ ලාභය ආදායම් බද්දට පෙර** | **21,432** | **5,554** |
| ආදායම් බදු | (6,300) | (1,720) |
| **වර්ෂයේ ශුද්ධ ලාභය** | **15,132** | **3,834** |

සමාගම් දෙකේම ස්කන්ධ ප්‍රකාශවලින් උපුටාගත් ලාභාලාභ තීරුවල සංඛ්‍යා පහත වේ.

| | **රු.'000** | |
|---|---|---|
| | **සී/ස අසංග** | **සී/ස බණ්ඩාර** |
| 2007.04.01 දිනට ලාභාලාභ ශේෂය | 25,500 | 5,200 |
| වර්ෂයේ ලාභය | 15,132 | 3,834 |
| පොදු සංචිතයට මාරුකිරීම් | (1,200) | (600) |
| <u>අතුරු ලාභාංශ</u> | | |
| වරණීය | (2,100) | (400) |
| සාමාන්‍ය | (800) | (800) |
| <u>යෝජිත ලාභාංශ</u> | | |
| වරණීය | (700) | (400) |
| 2008.03.31 දිනට ලාභාලාභ ශේෂය | 35,832 | 6,834 |

**පහත තොරතුරු ඔබට දී ඇත.**

(1) සීමාසහිත බණ්ඩාර සමාගම වර්ෂය තුළ දී අසංග සමාගමට කළ විකුණුම්වල ඉන්වොයිස් අගය රු. 6,400,000/- ක් වූ අතර භාණ්ඩ විකිණීමේ පිරිවැයට 20% ක ලාභයක් එකතු කර ඇත. මෙලෙස ගත් භාණ්ඩවලින් රු. 1,800,000/- ක තොගයක් වර්ෂය අවසානයේ දී අසංග සමාගමේ තොගයේ විය.

(2) සීමාසහිත අසංග සමාගම බණ්ඩාර සමාගමේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 70% ක් සහ වරණීය කොටස් ප්‍රාග්ධනයෙන් 40% ක් අත්පත් කරගන්නා ලද්දේ 2006.04.01 දින දී ය. එදිනට බණ්ඩාර සමාගමේ රඳවාගත් ලාභ ශේෂය රු. 3,600,000/- ක් විය.

(3) සී/ස බණ්ඩාර සමාගම, අසංග සමාගමට 2007.10.01 රු. 4,000,000/- ක ණයක් සපයා ඇති අතර, වාර්ෂික පොලිය 18% කි. මෙම පොලී සඳහා කිසිදු සමාගමක් අවශ්‍ය ගැලපීම් කර නැත.

(4) සමාගම් දෙක අතර වර්ෂය තුළ දී සිදු වූ අනෙකුත් ගනුදෙනු පහත වේ.

   (a) බණ්ඩාර සමාගම අසංග සමාගමෙන් ගොඩනැගිල්ලක් කුලියට ගෙන ඒ සඳහා මසකට රු. 60,000/- බැගින් කුලියක් ගෙවීම.

   (b) අසංග සමාගම බණ්ඩාර සමාගමට කාර්තුවකට රු. 200,000/- බැගින් කළමනාකරණ ගාස්තුවක් ගෙවීම.

(5) සීමාසහිත අසංග සමාගම තම ලාභාංශ ආදායම ගිණුම්ගත කර ඇත්තේ උපචිත පදනමට ය.

(6) ඒකාබද්ධකරණය මත ඇති වූ කීර්තිනාමයෙන් රු. 60,000/- ක් හානිකරණය වී ඇති බව අනාවරණය වී ඇත.

**පහත දෑ සකස් කරන්න.**

(i) 2008.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනය. **(ලකුණු 12)**

(ii) 2008.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ රඳවාගත් ලාභ සංචලනය. **(ලකුණු 12)**

**(මුළු ලකුණු 18)**

**<u>ප්‍රශ්න අංක 02</u>** *(ලකුණු 21)*

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අදාළව පහත දෑ සඳහා පිළිතුරු සපයන්න.

(a) (i) ශ්‍රී.ල.ගි.ප්‍ර. 37 අනුව සංවර්ධන වැය ප්‍රාග්ධනගත කිරීමේ දී ඒ සඳහා සළකා බලන නිර්ණායකයන් 5 ක් සඳහන් කරන්න. **(ලකුණු 02)**

(ii) 2006/2007 වර්ෂය තුළ දී සමාගමක් දරණ ලද පර්යේෂණ වැය රු. 300,000/- ක් වූ අතර, සංවර්ධන වැය රු. 900,000/- ක් විය. සංවර්ධන වැය දරමින් වැඩි දියුණු කරන ලද භාණ්ඩයෙන් ඉදිරි වර්ෂ 5 තුළ දී ඒකක 270,000 ක් විකිණිය හැකි වෙතැයි ඇස්තමේන්තු කර ඇත. 2007/2008 වර්ෂය තුළ දී සමාගමේ අදාළ නිෂ්පාදන, විකුණුම් ඒකක ප්‍රමාණය 30,000 කි. මෙම සංඛ්‍යා 2006/2007 සහ 2007/2008 ගිණුම් වර්ෂවල පෙන්වන්නේ කෙසේ ද? **(ලකුණු 02)**

(b) (i) ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනගත කළ හැක්කේ කිනම් වත්කම් සඳහා ද? එවැනි වත්කම් පිළිබඳව හැඳින්වීමක් කර උදාහරණ දෙකක් සපයන්න. **(ලකුණු 02)**

(ii) ණය ගැනුම් පිරිවැය ගිණුම්ගත කිරීමේ දී අනුගමනය කළ හැකි වරණීය ක්‍රම කවරේ ද? **(ලකුණු 01)**

(iii) ණය ගැනුම් පිරිවැය ශ්‍රී.ල.ගි.ප්‍ර. 20 හි විකල්ප ක්‍රමය අනුව ප්‍රාග්ධනිත කරන්නේ නම්, එලෙස ප්‍රාග්ධනිත කිරීම නවත්වන්නේ කිනම් අවස්ථාවන්හි දී ද? **(ලකුණු 02)**

(c) (i) ශ්‍රී.ල.ගි.ප්‍ර. 12 අනුව ශේෂ පත්‍ර දිනෙන් පසු සිදු වූ සිද්ධීන් වර්ගීකරණය කරන්නේ කෙසේ ද? එම දෙවර්ගය පිළිබඳව පැහැදිලි කිරීමක් කර උදාහරණ දෙක බැගින් සපයන්න. (ලකුණු 03)

(ii) X සහ සමාගම 2007/2008 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී පහත දෑ පිළිබඳව අනුගමනය කරන ගිණුම් ක්‍රියාමාර්ගය කවරේ ද? සමාගමේ ගිණුම් ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද්දේ 2007 ජුනි මස 5 දින බව සළකන්න. (ලකුණු 05)

1. 2008 මැයි මස අධිකරණය විසින් දී ඇති තීරණයක් පරිදි රු.400,000/- ක ණයගැතියෙක් බංකොලොත් බව ප්‍රකාශ කිරීම.
2. 2008.03.31 දිනට රු.500,000/- ක් වූ තොග 2007 මැයි 5 රු.400,000/- ක අගයකට උපලබ්ධි කිරීම.
3. 2007/2008 වර්ෂ සඳහා රු. 1,000,000/- ක අවසාන ලාභාංශයක් සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවිය යුතු යැයි 2007 මැයි 31 දින රැස්වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කිරීම.
4. 2008 මැයි 16 දින හටගත් ගින්නකින් ව්‍යාපාරයේ රු. 2,000,000/- ක ගබඩාවක් විනාශ වීම.
5. ශේෂ පත්‍ර දිනට සමාගමේ රු. 3,000,000/- අගය වූ ආයෝජනයක 2008 අප්‍රේල් මස වෙළපොලේ අගය පිරිවැයෙන් 40% කට සීමා කෙරිණි.

(d) (i) සමාගමක් 2004.10.01 දින රු. 1,600,000/- කට වත්කමක් මිල දී ගෙන වාර්ෂිකව 12 ½% බැගින් ක්ෂය වෙන් කරන ලදී. 2007/2008 ගිණුම් වර්ෂය තුළ දී අනාවරණය කරගන්නා ලද කරුණක් වූයේ මෙම වත්කමේ සමස්ත ජීවිත කාලය වර්ෂ 5 ක් පමණ බවයි. මෙම කරුණ ඔබ සළකන්නේ කිනම් දෙයක් වශයෙන් ද? 2007/2008 වර්ෂය සඳහා යන්ත්‍ර ක්ෂය (ලකුණු 02)

(ii) ශ්‍රී.ල.ගි.ප්‍ර. 10 අනුව ආයතනයක් විසින් භාවිත කරන ලද ගිණුම් ප්‍රතිපත්තියක් වෙනස් කළ හැකි අවස්ථාවන් කවරේ ද? (ලකුණු 02)

(මුළු ලකුණු 21)

**<u>ප්‍රශ්න අංක 03</u>** *<u>(ලකුණු 28)</u>*

සීමාසහිත සකුරා පොදු සමාගමකි. 2008 මාර්තු 31 දිනට එහි ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | රු. '000 හර | රු. '000 බැර |
|---|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (කොටස් 2,000,000) | | 20,000 |
| කොටස් අධිමිල ගිණුම (2007.04.01) | | 1,600 |
| රඳවාගත් ලාභ (2007.04.01) | | 11,800 |
| වරණීය කොටස් ප්‍රාග්ධනය | | 3,000 |
| **<u>දේපල, පිරියත හා උපකරණ පිරිවැයට</u>** | | |
| - ඉඩම් හා ගොඩනැගිලි (ඉඩම රු. 9,600,000/-) | 17,600 | |
| - ලී බඩු හා උපකරණ | 6,400 | |
| - මෝටර් වාහන | 11,200 | |
| **<u>ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් - 2007.04.01</u>** | | |
| - ගොඩනැගිලි | | 1,280 |
| - ලී බඩු හා උපකරණ | | 2,160 |
| - මෝටර් වාහන | | 4,800 |
| විකුණුම් | | 50,000 |
| විකුණුම් පිරිවැය | 40,200 | |
| තොග | 7,080 | |
| ලැබිය යුතු / ගෙවිය යුතු වෙළඳ ණය | 3,520 | 2,130 |
| 10% පරිවර්ත්‍ය ණයකර | | 4,000 |
| 12% බැංකු ණය | | 3,200 |
| පරිපාලන වියදම් | 5,640 | |
| බෙදාහැරීමේ වියදම් | 3,280 | |
| ගෙවූ පොලී | 524 | |
| ආදායම් බදු ගිණුම | 1,600 | |
| බදු වෙන්කිරීමේ ගිණුම - 2007.04.01 දිනට | | 130 |
| ගෙවූ කල්බදු වාරික (140,000 x 12) | 1,680 | |
| ගෙවූ අතුරු ලාභාංශ | 1,000 | |
| ආයෝජන (පිරිවැයට) | 2,000 | |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 2,376 | |
| | 104,100 | 104,100 |

**පහත තොරතුරු ඔබට දී ඇත.**

(1) 2007.04.01 දින සමාගම මෝටර් වාහනයක් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගත්තේ ය. වාහනයේ පිරිවැය රු. 4,200,000/- කි. කල්බදු කොන්දේසි අනුව රු. 140,000/- බැගින් වූ මාසික කල්බදු වාරික 36 කින් ගෙවිය යුතුය. 2008.03.31 දක්වා ගෙවන ලද කල්බදු වාරික ගෙවූ කල්බදු වාරික ගිණුමට හර කිරීම හැර වෙනත් කිසිදු ගැලපීමක් කර නැත. මෙම ගෙවීම් තුළ පොලී පිරිවැය රු. 260,000/- ක් ඇතුළත් විය.

(2) රු. 800,000/- ක් පිරිවැය වූ එක් උපකරණ අයිතමයක් 2007.03.31 දින වනවිට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණි. 2007.04.01 දින රු. 400,000/- ක් පිරිවැය වූ නව උපකරණයක් මිල දී ගෙන ඇත. දේපල, පිරියත හා අපකරණ පහත සඳහන් අනුපාතයන්ට ක්ෂය කිරීම සමාගමේ ප්‍රතිපත්තියයි.

| | |
|---|---|
| ගොඩනැගිලි වර්ෂයකට | 5% බැගින් |
| ලී බඩු හා උපකරණ වර්ෂයකට | 10% බැගින් |
| මෝටර් වාහන වර්ෂයකට | 25% බැගින් |

(3) ආයෝජන පිළිබඳව විග්‍රහය පහත දැක්වේ.

| | රු. |
|---|---|
| වෙළඳ ආයෝජන | 600,000 |
| දීර්ඝ කාලීන ආයෝජන | 800,000 |
| 18% ස්ථාවර තැන්පතු (2009.12.31 කල් පිරෙන) | 600,000 |
| | 2,000,000 |

වෙළඳ ආයෝජනවල වෙළඳ අගය රු. 700,000/- කි. දීර්ඝ කාලීන ආයෝජනවල වෙළඳ අගය රු. 900,000/- කි. ජංගම ආයෝජන / වෙළඳ ආයෝජන වෙළඳ අගයට අගය කිරීම සමාගමේ ප්‍රතිපත්තියයි.

(4) 2006/2007 වර්ෂය සඳහා ආදායම් බදු රු. 180,000/- ක් 2007/2008 වර්ෂයේ දී ගෙවා තිබූ අතර, මෙම වර්ෂයේ ආදායම් බද්ද 1,820,000/- කට ඇස්තමේන්තු කර ඇත.

(5) ණයකර පොලිය සෑම වර්ෂයකම අර්ධ වාර්ෂිකව සැප්තැම්බර් 30 හා මාර්තු 31 ගෙවනු ලබයි. 2007/09/30 න් අවසන් මාස 6 සඳහා පොලිය දැනටමත් ගෙවා ඇත. 2008/03/31 දිනට ණයකරවලින් 50% ක් ඒවාට උපචිත වූ පොලිය සමඟ එකක් රු. 12.50 බැගින් වන සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීමට සමාගම තීරණය කරන ලදී. මේ සඳහා ගැලපීම් සටහන් මෙතෙක් සටහන් කර නොමැත.

(6) 2007 අප්‍රේල් 01 දින 12% බැගින් රු. 4,000,000/- ක බැංකු ණයක් සමාන මාසික වාරික 40 කින් ආපසු ගෙවීම සඳහා ලබාගත්තේ ය. 2007/08/31 දින පළමු වාරිකය ගෙවීම ආරම්භ කර සෑම මාසයකම අවසාන දිනයේ දී එදිනට උපචිතව ඇති පොලිය ද සහිතව වාරික ගෙවිය යුතුය. වර්ෂය සඳහා අදාළ බැංකු ණය පොලිය නිසි පරිදි ගෙවා ඇත.

(7) ලැබිය යුතු ගිණුම්වලින් රු. 180,000/- ක් බොල්ණය වශයෙන් කපාහරින්න. ඉතිරි ශේෂයෙන් 10% ක ප්‍රමාණයක් අඩමාන ණය සඳහා වෙන් කළ යුතුය.

(8) සමාගම 2007/10/01 දින රු. 30/- බැගින් වූ ප්‍රතිෂ්ඨාවකට නව වරණීය කොටස් 100,000 ක් නිකුත් කර ඇත. මෙම වරණීය කොටස් සඳහා වර්ෂයකට කොටසකට රු. 1.50 බැගින් ලාභාංශයක් ගෙවිය යුතු වේ. වර්ෂය තුළ දී ගෙවූ අතුරු ලාභාංශ මගින් නිරූපණය කරන්නේ සාමාන්‍ය කොටස් හිමියන්ට කොටසකට ශත 50 බැගින් ගෙවන ලද අතුරු ලාභාංශයයි. සාමාන්‍ය කොටස් හිමියන්ට අධ්‍යක්ෂවරු විසින් යෝජිත අවසාන ලාභාංශය කොටසකට රු. 1/- කි.

(9) සමාගම විසින් ශේෂ පත්‍ර දින වන විට අත්සන් කර ඇති ප්‍රාග්ධන ඉදිකිරීම් සඳහා වූ ගිවිසුම්වල අගය රු. 5,000,000/- කි.

| | රු. |
|---|---|
| විගණන ගාස්තු හා වියදම් | 120,000 |
| අධ්‍යක්ෂක පාරිශ්‍රමිකය | 160,000 |
| පරිත්‍යාග | 72,000 |

(10) 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන් අනුව මෙම වර්ෂය සඳහා ගිණුම් සකස් කළ යුතු වේ.

**පහත දෑ සකස් කරන්න.**

(a) 2008.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත සකුරා සමාගමේ ප්‍රසිද්ධ කිරීම සඳහා ආදායම් ප්‍රකාශනය **(ලකුණු 09)**

(b) 2008.03.31 දිනට ශේෂ පත්‍රය **(ලකුණු 07)**

(c) 2008.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය **(ලකුණු 04)**

(d) දේපල, පිරියත හා උපකරණවල සංචලන පෙන්වන ප්‍රකාශනය **(ලකුණු 05)**

(e) අනිකුත් අදාළ සටහන් **(ලකුණු 03)**

**(මුළු ලකුණු 28)**

**<u>ප්‍රශ්න අංක 04</u>** *(ලකුණු 19)*

ලාභාලාභ 5 : 3 : 2 අනුපාතයට බෙදාගන්නා A, B හා C හවුල් ව්‍යාපාරයේ පොත්වලින් 2008.03.31 දිනට උපුටාගත් ශේෂ පත්‍රය පහත වේ.

| | | |
|---|---|---|
| <u>වත්කම්</u> | | **<u>රු. '000</u>** |
| **<u>ජංගම නොවන වත්කම්</u>** | | |
| **<u>දේපල, පිරියත හා උපකරණ</u>** | | |
| ඉඩම් හා ගොඩනැගිලි | | 1,400 |
| මෝටර් වාහන | | 4,400 |
| අනිකුත් දේපල, පිරියත හා උපකරණ | | 8,320 |
| | | 14,120 |
| ආයෝජන | | 640 |
| කීර්තිනාමය | | 360 |
| | | 15,120 |
| **<u>ජංගම වත්කම්</u>** | | |
| තොගය | 4,160 | |
| ලැබිය යුතු ගිණුම් | 3,840 | |
| බැංකු හා මුදල් | 480 | 8,480 |
| **මුළු වත්කම්** | | **23,600** |
| | | |
| **<u>ස්කන්ධය හා බැරකම්</u>** | | |
| **<u>ප්‍රාග්ධන ගිණුම්</u>** | | |
| A | 3,360 | |
| B | 2,400 | |
| C | 1,920 | 7,680 |
| | | |
| **<u>ජංගම ගිණුම්</u>** | | |
| A | 720 | |
| B | 560 | |
| C | 300 | 1,580 |
| | | 9,260 |
| 2007/2008 වර්ෂය සඳහා ලාභය | | 3,360 |
| | | 12,620 |
| **<u>ජංගම නොවන බැරකම්</u>** | | |
| බැංකු ණය | 2,400 | |
| B ගේ ණය | 1,600 | 4,000 |
| | | |
| **<u>ජංගම බැරකම්</u>** | | |
| ණයහිමියන් / ගෙවිය යුතු ගිණුම් | 5,280 | |
| උපචිතයන් | 1,700 | 6,980 |
| **මුළු ස්කන්ධය හා බැරකම්** | | **23,600** |

හවුල් ව්‍යාපාරය 2008.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සීමාසහිත පෞද්ගලික සමාගමක් බවට පරිවර්තනය කිරීමට තීරණය විය. ඒ සඳහා සීමිත ABC (පෞද්ගලික) සමාගම සංස්ථාපනය කළ අතර, එම සමාගම විසින් හවුල් ව්‍යාපාරයේ ආයෝජන සහ කීර්තිනාමය හැර අනෙකුත් වත්කම් සියල්ලම ද, B ගේ ණය හැර බැරකම් සියල්ලම ද පවරා ගැනීමට තීරණය කර ඇත.

පහත තොරතුරු ඔබට දී ඇත.

(1) ධාරණ අගය රු. 800,000/- ක් වූ මෝටර් රථයක් රු. 900,000/- කට විකුණූ අතර, ආයෝජන උපලබ්ධියෙන් ලද මුදල රු. 800,000/- කි. හවුල් ව්‍යාපාරය B ගේ ණය මුළුමනින්ම පියවීමට රු. 1,440,000/- ක් ගෙවා දමන ලදී. උපලබ්ධියේ දී දරණ ලද වියදම රු. 64,000/- ක් වූ අතර, සමාගමට බඳවා නොගන්නා සේවකයින් සඳහ ඔවුනට රු. 320,000/- ක වන්දියක් ගෙවීමට සිදු විය.

(2) හවුල් ගිවිසුම් ප්‍රකාරව හවුල්කරුවන්ට ප්‍රාග්ධනය සඳහා 5% ක වාර්ෂික පොලියක් සහ සෑම හවුල්කරුවෙකුටම මසකට රු. 24,000/- බැගින් වේතනයකට හිමිකම ඇත.

(3) හවුල් ව්‍යාපාරයේ 2008.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බෙදිය හැකි ලාභය මත ආදායම් බද්ද රු. 412,000/- කි. 2007/2008 වර්ෂය තුළ දී ස්වතක්සේරු ක්‍රමයට හවුල් ව්‍යාපාරය විසින් ගෙවූ රු. 160,000/- ක ආදායම් බද්ද ලැබිය යුතු ගිණුම්වලට ඇතුළත් කර ඇත. හවුල් ව්‍යාපාරය විසින් 2008.03.31 දිනට ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද ගෙවීමට A එකඟ විය.

(4) නව සමාගම හවුල් ව්‍යාපාරය පවරා ගැනීමේ ප්‍රතිෂ්ඨාව පියවීමට සාමාන්‍ය කොටස් 400,000 ක් රු. 22/- බැගින් ද, වරණීය කොටස් 120,000 ක් රු. 18/- බැගින් ද හවුල් ව්‍යාපාරයේ කොටස්කරුවන්ට විභජනය කිරීමට එකඟ වන ලදී.

(5) ABC සමාගම පවරා ගන්නා වත්කම් පහත අගයන්ට ගිණුම්ගත කෙරේ.

| | **රු.'000** |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 2,000 |
| මෝටර් වාහන | 3,200 |
| අනෙකුත් දේපල හා පිරියත | 8,800 |

ඉහත වත්කම් හැර අනෙක් වත්කම් සමාගම විසින් පොත් අගයට සටහන් කරන අතර, ලැබිය යුතු ගිණුම් වෙනුවෙන් 10% ක අඩමාන ණය ප්‍රතිපාදනයක් ඇති කෙරේ. සේවක පාරිතෝෂික සඳහා රු. 600,000/- ක් වෙන් කිරීමට ද සමාගම තීරණය කරන ලදී.

(6) හවුල්කරුවන්ට විභජනය කරන ලද කොටස් හැර ABC සමාගම තම හිතවතුන්ට පෞද්ගලිකව සාමාන්‍ය කොටස් 200,000 ක් රු. 24/- බැගින් ද, වරණීය කොටස් 40,000 ක් එකක් රු. 20/- බැගින් ද නිකුත් කර මුදල් ලබාගන්නා ලදී. සමාගම සංස්ථාපනය හා බැඳුණු ක්‍රියාකාරකම් සඳහා දරණ ලද වැය රු. 132,000/- කි.

**පහත දෑ සකස් කරන්න.**

(a) හවුල් ව්‍යාපාරය වැසීම සඳහා අවශ්‍ය ගිණුම් **(ලකුණු 12)**

(b) සමාගමේ ආරම්භක ශේෂ පත්‍රය **(ලකුණු 07)**

**(මුළු ලකුණු 19)**

**ප්‍රශ්න අංක 05** *(ලකුණු 14)*

X සමාගමේ 2008 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ සංක්ෂිප්ත ආදායම් ප්‍රකාශනය සහ එදිනට කාරක ප්‍රාග්ධන සංචරක ශේෂයන් අනුරූප සංඛ්‍යා ද සමග පහත දක්වා ඇත.

2008 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශනය

| | **රු. '000** |
|---|---|
| විකුණුම් | 53,000 |
| විකුණුම් පිරිවැය | (33,600) |
| දළ ලාභය | 19,400 |
| වියදම් | (10,200) |
| ආදායම් බදුවලට පෙර ශුද්ධ ලාභය | 9,200 |
| ආදායම් බදු | (2,400) |
| බදුවලට පසු ශුද්ධ ලාභය | 6,800 |
| යෝජිත ලාභාංශ | (1,000) |
| රඳවාගත් ලාභ | 5,800 |

වර්ෂයේ වියදම්වල රු. 1,120,000/- ක්ෂය කිරීම් සහ පොලී වියදම රු. 600,000/- ක් ඇතුළත් ය.

| | **රු. '000** | |
|---|---|---|
| **දිනට ජංගම වත්කම් හා බැරකම්** | **2008.03.31** | **2007.03.31** |
| තොග | 2,560 | 2,240 |
| ලැබිය යුතු වෙළඳ ණය | 1,680 | 1,820 |
| මුදල් හා මුදලට සමාන දෑ | 1,570 | 960 |
| ගෙවිය යුතු වෙළඳ ණය | 1,040 | 860 |
| උපචිත වියදම් | 420 | 560 |
| ගෙවිය යුතු ආදායම් බදු | 1,040 | 500 |
| ගෙවිය යුතු ලාභාංශ | 1,000 | - |
| උපචිත පොලී | 350 | 400 |

ශ්‍රී.ල.ගි.ප්‍ර. 09 අනුව වක්‍ර ක්‍රමය (Indirect Method) භාවිත කර 2008 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ඇති වූ මුදල් ප්‍රවාහය පිළියෙල කරන්න.

**(මුළු ලකුණු 14)**

***ප්‍රශ්න පත්‍රය අවසානයි***